# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1848/29 - 2014 පෙබරවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2014.02.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 24/51(viii)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 128අ වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

කුමාර වෙල්ගම,
ප්‍රවාහන අමාත්‍ය.

2014 ජනවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මෙම නියෝග 2014 අංක 03 දරන "මෝටර් වාහන" (මඟී සේවා රියදුරු බලපත්‍ර) නියෝග යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු අතර, 2015.01.01 දින සිට බලාත්මක විය යුතු ය.

2. මඟීන් ගෙන යාම සඳහා වන පොදු සේවා වාහනයක් ලෙස මෝටර් කෝච් රථයක් පදවන රියදුරෙකුට තත් කාර්ය සඳහා මේ පනතේ 128අ වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් විශේෂ පිටසනක් මගින් බලය දී ඇත්නම් මිස යම් වාහන පන්තියක හෝ පන්ති සඳහා බලපත්‍රයක් හිමි කිසිදු තැනැත්තකු විසින් එවැනි මෝටර් වාහනයක් පැදවීම නොකළ යුතු ය.

3. මඟීන් ගෙන යාම සඳහා වන යම් පොදු සේවා වාහනයක රියදුරකු වීමට අදහස් කරන යම් වාහන පන්තියක් හෝ වාහන පන්ති සඳහා යම් බලපත්‍රයක් දරන්නකු විසින් කොමසාරිස් ජනරාල්වරයා විසින් විශේෂ පිටසනක් නිකුත් කිරීම සඳහා වන ගාස්තුවක් ලෙස රුපියල් දෙදහසක (රු. 2,000) මුදල් ගෙවීමක් සමඟ මෙම නියෝගවල උපලේඛනයේ දක්වා ඇති ආකෘතියෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

4. පොදු සේවා වාහනයක් වන මෝටර් කෝච් රථයක් පැදවීමට විශේෂ පිටසනක් ලබා ගැනීමට ඉල්ලුම්කරු විසින් පහත දැක්වෙන නියමයන් සහ සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබිය යුතු අතර, ඔහු,




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(i) වයස අවුරුදු 23ත් 65ත් අතර (දෙකම ඇතුළුව) තැනැත්තකු විය යුතු බවට ;

(ii) මෝටර් කෝච් රථයක් සඳහා සාමාන්‍ය රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසුව වසර දෙකක රිය පැදවීමේ පළපුරුද්දක් ලබා ගෙන ඇති බවට ;

(iii) කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය හෝ වෙනත් යම් ආයතනයක් මගින් නිකුත් කළ වෛද්‍ය සහතිකයක් ලබා ගෙන ඇති බවට ;

(iv) කොමසාරිස් ජනරාල්වරයා විසින් යම් ප්‍රථමාධාර පාඨමාලාවක් පවත්වාගෙන යාමට ලියවිල්ලකින් බලය දුන් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය හෝ වෙනත් යම් ආයතනයක් මගින් පවත්වන ප්‍රථමාධාර පාඨමාලාවක් සම්පූර්ණ කර ඇති බවට ;

(v) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් ලියවිල්ලකින් බලය දුන් වෙනත් යම් ආයතනයකින් පවත්වන කාර්මික දැනුම පිළිබඳ පරීක්ෂණය සමත්වී ඇති බවට ;

(vi) යම් පුහුණු කිරීමේ පාඨමාලාවක් පවත්වාගෙන යාමට කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියවිල්ලකින් බලය දුන් ආයතනයක් විසින් පවත්වාගෙන යන පුහුණු පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර ඇති බවට ; සහ ;

(vii) ශ්‍රී ලංකාවේ බලපවත්වන යම් නීතියක් යටතේ අපරාධයක් සිදු කිරීම පිළිබඳ කිසිදු වාර්තාවක් නොමැති බවට.

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කළ යුතු ය.

5. මේ නියෝගවල -

"පනත" යන්නෙන් (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත අදහස් වේ.

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන් මේ පනත යටතේ පත් කරන ලද මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ.

"පොදු සේවා වාහනය" යන්නෙන් ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා මගීන් රැගෙන යාම සඳහා භාවිතා කරන හෝ අනුවර්තිත හෝ තබා ඇති යම් මොටර් වාහනයක් අදහස් වේ.

### *උපලේඛනය*

### *පොදු සේවා වාහන පැදවීමට විශේෂ පිටසනක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය*

1. මුලකුරු සමග නම :——————.
2. සම්පූර්ණ නම :——————.
3. ලිපිනය :——————.
4. දිස්ත්‍රික්කය :——————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :——————.
6. උපන් දිනය — දිනය ☐☐ මාසය ☐☐ වර්ෂය ☐☐☐☐
7. ස්ත්‍රී පුරුෂ භාවය - (ස්ත්‍රී/පුරුෂ) ☐
8. උස :-සෙන්ටිමීටර් වලින් ☐
9. රැකියාව :——————.
10. බලපත්‍රය වලංගු වන්නා වූ වාහන පන්තිය හෝ වාහන පන්ති :——————.
11. ඉල්ලුම්කරුගේ රියදුරු බලපත්‍රයේ තොරතුරු :

| | |
|---|---|
| (අ) රියදුරු බලපත්‍ර අංකය :- | (ආ) නිකුත් කළ දිනය :-<br>දිනය ☐☐ මාසය ☐☐ වර්ෂය ☐☐☐☐ |
| (ඇ) වාහන පන්තිය හෝ පන්ති :- | (ඈ) ඉකුත් වන දිනය :-<br>දිනය ☐☐ මාසය ☐☐ වර්ෂය ☐☐☐☐ |
| (ඉ) රියදුරු අභිවෘද්ධි ලකුණු<br>(ඉල්ලුම්පත් ඉදිරිපත් කරන අවස්ථාව වන විට ඇත්නම්) | |

12. රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමේ දී ඔබ අසමත් වී ඇත්නම් හෝ ඔබගේ බලපත්‍රය අධිකරණයකින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් අවලංගු කර හෝ අත්හිටුවා ඇත්නම් එම සිද්ධිය පිළිබඳව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය පිළිබඳ තොරතුරු ලබා දෙන්න

..............................................................................................................................................................................
..............................................................................................................................................................................
..............................................................................................................................................................................
..............................................................................................................................................................................

උප්පැන්න සහතිකයේ සහ ජාතික හැඳුනුම්පතේ මුල් පිටපත් ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, ඒවායේ එක් එක් ඡායා පිටපත බැගින් පිටසන් කිරීම සඳහා වන ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

ඉල්ලුම්කරුගේ අත්සන :————.

දිනය :————.

02-575

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.